# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2143/46 - 2019 ඔක්තෝබර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

කොප්‍රාලේ/ඉඅත්/3/77/PS.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තරය:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (කොට්ඨාස අංක 20, කොළඹ මහ නගර සභා සීමාව තුළ) කොටුව ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2019.02.05 දිනැති මූලික පිඹුරු අංක කො. 9782 හි හෙක්. 0.2054ක ප්‍රමාණයෙන් යුත් කැබලි අංක 1 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 1**

වරිපනම් අංකය: 17 (කොටසක්), 175/1 සහ 17 8/1, ජනාධිපති මාවත; හිමිකම: රජය; මුල් හිමිකම: අංක 37, යෝර්ක් වීදිය, කොළඹ 01 ලිපිනයේ පිහිටි ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව; වර්තමාන පරිහරණය සහ විස්තරය: මහල් 06ක් සහිත ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; ප්‍රමාණය: හෙක්. 0.2054.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ඔක්තෝබර් මස 30 වැනිදින පෙ.ව. 10.00 ට කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, ඉඩම/පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් වන්දි ඉල්ලීමට ඇති කරුණු, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් ඒ පිළිබඳ විස්තරත් 2019 ඔක්තෝබර් මස 23 වැනි දිනට මත්තෙන් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී. පී. වික්‍රමසිංහ,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
කොළඹ.

2019 සැප්තැම්බර් මස 05 වැනි දින,<br>
කොළඹ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

10-625

1A -G 31173 - 47 (2019/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය :* CHI/LND.1/AC/4/14
L/03J/95/PC/231.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආනවිලුන්දන් පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 578, පිටිපන උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හලාවත කොට්ඨාස අංක 8 - කොළඹ පාර (හලාවත නගර සහා සීමාව තුළ) ගමේ පිහිටි පුත්තලම මිනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක මූ.පි.පු. 4849 හා 2011.09.30 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටස්.

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: කලිගාල; විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: වර්ණකුලසූරිය මේරි මාලනී ප්‍රනාන්දු සහ රජිනා ජසින්තා, කොළඹ පාර, හලාවත; ප්‍රමාණය: හෙක්. 0.0132.

02. **කැබලි අංක 2**
ඉඩමේ නම: කලිගාල; විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: මිහිඳුකුලසූරිය එම්මානුවෙල් පෙරේරා, කොළඹ පාර, හලාවත; ප්‍රමාණය: හෙක්. 0.0090.

03. **කැබලි අංක 3**
ඉඩමේ නම: කලිගාල; විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: මිහිඳුකුලසූරිය ඇන්ඩෲ ජයන්තා හිලරියන් ප්‍රනාන්දු, කොළඹ පාර, හලාවත; ප්‍රමාණය: හෙක්. 0.0090.

04. **කැබලි අංක 4**
ඉඩමේ නම: කලිගාල; විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ඒ.ෂෙල්ටන් ආනන්ද ෆොන්සේකා, කොළඹ පාර, හලාවත; ප්‍රමාණය: හෙක්. 0.0050.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2019 දෙසැම්බර් මස 23 වැනි දින පෙ.ව. 10.00 ට හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 දෙසැම්බර් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී.එම්.ඒ.කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
හලාවත.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-626

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.